


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ පොසොන් මස කලාපය, රා. ව. 2016 ක් වූ ජුනි මස 19 වන දින**

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# නෙරපා හැරියත් අත් නොහැර ඇසුරු කළ යුත්තෙකු සතු ගුණ හත

ධම්කාමී පින්වතුනි,

පියො ච ගරු භාවනීයො - වතතාච වචනකඛමො

ගමභීරකදච කථං කතතා - නො චටඨානෙ නියොජයෙ

( අංගුත්තර නිකාය භිකඛු මිතත සුත්‍රය )

අද පොසොන් පුර පසළොස්වක පොහොය දිනයයි. අනු බුදුරජාණන් වූ මිහිඳු මාහිමියන් වහන්සේ ලක්දිවට වැඩම වීම, ලක්දිව බුදු සසුන පිහිටු වීම යන ප්‍රධාන වැදගත් සිදුවීම් සිහිපත් කරන දිනයයි.

අද මෙම දහම් පණිවුඩයට මාතෘකාව කරගනු ලබන්නේ සූත්‍ර පිටකයෙහි අංගුත්තර නිකායෙහි ''භිකඛු මිතත සුත්‍රය''යි. භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේදී දේශනා කරන්නට යෙදුන දේශනාවකි. විශේෂයෙන් භික්ෂුන් වහන්සේලාගේ මිත්‍රත්වයේ ලක්‍ෂණය පිළිබඳව දෙසූ දහමක් වුවද, හැමදෙනාටම එකසේ වැදගත් වන දෙසුමකි. අද දින අප ලක්වැසි බෞද්ධ ගිහි පැවිදි දෙපාර්ශ්වයම මහත් ශ්‍රද්ධාවෙන් සිහිපත් කරන මිහිඳු මහරහතන් වහන්සේ ද මේ සුත්‍රයේ දැක්වෙන පරිදි කරුණු සතකින් සමන්වාගත උතුමෙකි. අපගේ ශාස්තෘන් වහන්සේ වන බුදු පියාණන් වහන්සේ මේ ගුණ හතෙන් ඉතා පිරිපුන් වන සේක. මිහිඳුහිමියන්ද අප ලක් වැසියන්ට අනු බුදු වුයේ එම ගුණ හත උන්වහන්සේ සතුව පැවති නිසාය.

**1. ප්‍රිය මනාප වෙයි. 2. ගුරු වෙයි. 3.බුහුමනට නිසි වෙයි. 4. වක්තෘද වෙයි.**

**5. වචනක්‍ෂමද වෙයි 6. ගම්භීර කථා කරන්නේද වෙයි.7. අස්ථානයෙහිද නොයොදවයි. මේ කරුණු හත තුළ බුදු රජාණන් වහන්සේ පිහිටා තම ශ්‍රාවක සමූහයාටද පිහිටන ලෙස අවවාද කළහ.**

ප්‍රියවූයේ වේද (පියො ච)

මිත්‍ර යන්නෙහි අර්ථය වැඩ සලසන අදහස් ඇති බැවින් ප්‍රේම කරයි. අවැඩෙන් වළක්වන බැවින් ආරක්‍ෂා කරයි. එබැවින් මිත්‍ර නම් වේ. තවත් වචනයකින් කියන්නේ නම් සත්පුරුෂයාය. භාග්‍යවතුන් වහන්සේ යහපත් මිත්‍රයාගේ ලක්‍ෂණ හතරක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේද මෙසේ සඳහන් කරනවා. මේ ලෝකයේ කවර තරාතිරමක වුවද, යම් කිසි කුල පුත්‍රයෙක් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවන්තද, සීල සම්පන්න හෙවත් සිල්වත්ද, ත්‍යාග සම්පන්න හෙවත් දීමෙහි යෙදේද, ප්‍රඥාවන්තවේද ඔහු සමග යමෙක් ඇසුරක්වේද, එම ගුණ අනුව ඔහුද හික්මෙයි නම් ඒ කල්‍යාණ මිත්‍රත්වයයි වදාරා ඇත. එහි ඇත්තේද ප්‍රියමනාපවීමේ සාධකයෝය. එදා කාලිංග යුද්ධයේදී සිදු වූ මිනිස් ඝාතනයෙන් චිත්ත සන්තාපව සිටි. ධර්මාශෝක අධිරාජයා මලක්, දල්ලක් සේ මෙළෙක් වූයේ සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ ප්‍රියමනාප වූ පැවතුම් දැකීමෙනි. ඒ නිසාම ප්‍රිය මනාප මිත්‍ර ගුණයෙන් යුතු මිහිඳු හිමියන් විසින් තුන්ලොවටම ප්‍රිය මනාපයෙන් අග්‍ර වූ බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අපට දායාද කළ සේක. එම ධර්මයට විනයට අනුව ජීවත් වන ලක්වැසි බෞද්ධයෝ වන අපද ප්‍රිය මනාප ගුණයෙන් හෙබි යා වූ මිහිඳු මහරහතන් වහන්සේ ආදර්ශ කොට සමාජයට

ප්‍රියමනාප මිත්‍රයෙක්වේද එවිට සූත්‍රයේ සඳහන් පරිදි මේ ලෝකයේ යම්කිසි පුද්ගලයෙකු ලඟ මේ ගුණ හත පවතීනම් ඔහු විසින් ඇසුරු කරන්නාට යහපත පිණිස අනුකම්පාවෙන් කටයුතු කරයි නම්, යම් විටෙක යම් කාරණයකදී පළවා හැරියත් එය ඉවසා ඒ ගුණවත් පුද්ගලයා ඇසුරු කළ යුතුය යන බුද්ධ අවවාදය අනුව අප ඇසුරු කරන්නන් අප විසින් එළවා දැමුවත් ඔවුන් අප අත් නොහැර සිටීවි. යමෙකු ළඟ ඒ ගුණ  ඇත්නම් ඔහු අපව එළවා දැමුවොත් අප විසින් ඔහු අත් නොහරිමු. ඒ මන්ද යත් ඔහුගෙන් වැඩක්ම මිස අවැඩක් නොවන නිසාය. බුදුරජාණන් වහන්සේ කොතෙකුත් තම ශ්‍රාවකයන් නෙරපා අර්ථයෙහි නැවත පිහිටුවා ඇත  ඒ අනුකම්පාවෙන්මය.

ගුරුවූයේ ද වෙයි. (ගරු ච) මව්පියෝ දරුවන්ට පළමු ගුරුවරුන්ය. ඔවුන්ගේ දුටු දුටු වරද ඒ ඒ අවස්ථාවෙහි කියා දීමෙන්ද, මතු දියුණුවට උවමනා උපදෙස් දීමෙන්ද ඔවුන් නිසිමගට පමුණුවයි. ඒ ඔවුන්ගේ වගකීමයි. ලෝක සම්මත වූ ශිල්ප ශාස්ත්‍ර උගන්වන ගුරුවරුද තම ශිෂ්‍යයන්ට තම චරිතයෙන්ද ආදර්ශ දෙති. සිසු දරුවන්ගේ නැණ, බල, පමණ දැන කටයුතු කරති. මුදල ගැන හිතා නොව මතු පරපුරෙහි අභිවෘධිය තකා ඔවුන්ට ශිල්ප ශාස්ත්‍රයෙහි පුහුණුව කරුණා මෛත්‍රියෙන්ම දෙති. ඒ ගුරුවරු සතුව බොරු ගරු මාන්න නැත පෞද්ගලික බලාපොරොත්තු නැත. මව්පියන්ගේ නොසැළකිල්ල නිසා නොමගට යන්නේ ඔවුන්ගේ දූ දරුවෝ පමණි. එහෙත් සිප්සතර දෙන ගුරුවරුන්ගේ නොසැළකිල්ල ඇති වුවහොත් මතු පරපුරම නොමගට යයි. බුදු රජාණන් වහන්සේ තුන් ලෝකයටම ගුරු වූ නිසා තිලෝ ගුරු යයිද හඳුන්වති. මිහිඳු මා හිමියෝ ලක් වැසි බෞද්ධයාට ගුරු වෙති. අප ශිෂ්‍යයෝ වෙමු. උන් වහන්සේ අප ජාතියට  කිසිදු අඩුවක් නැතිව මග කියා දුන්හ.  අද වන විට ඒ මග වරද්දා ගත් අය සිටිති. ඒ ගුරුකම් ලබා ගැනීමේ ආකාරයේ වරදයි. ඔවුන් වෙනත් මිත්‍යාවන් නියම මග යයි. සිතා හැම අතින්ම දුකට පත් වේ. ජීවිත අකාලයේ නැති කර ගනිති. අපේ පැරණි ගිහි පැවිදි වැඩිහිටියෝ කියන්නේ "අපේ ගුරුවරු අපට දඬුවම් දුන්නා තැළුවා නෙරපුවා  සියල්ල අපි ඉවසුවා. ඒ අපේ යහපත නිසා බව දැන් අපට තේරෙනවා." යනුවෙනි මෙහි දැක්වෙන ගුණ ඇති ගුරුවරයා දඬුවම් දුන්නත් යහපතට නිසා ඉවසිය යුතුය. බුදු රජාණන් වහන්සේ  සහ මිහිඳු හිමියන් ආදර්ශ කොට අපිද එවැනි ගුරු බවක් ඇති කර ගෙන බාල පරපුරට මග කියා දෙමු. අපිට සමාජගතව හිම් තැන බබළවමු. අප පසුපස තවත් පරපුරක් එනබව හැරී බලමු. ඒ නිවැරදි මිත්‍ර ධර්මයයි.

බුහුමනට නිසිද වෙයි. ( භාවනීයො ) ඇසුරු කළ යුතු මිත්‍රයාගේ ලග තිබිය යුතු ඊළඟ කාරණය ගෞරව කිරීමට බුහුමන් කිරීමට සුදුසු වෙයි යන්නයි. සියලු කෙලෙස් මල දුරු කළ නිසා තුන් ලෝ වාසීන්ගේ ආමිසය ප්‍රතිපත්තිය පුදා ගරු බුහුමන් කිරීමට භාග්‍යවතුන් වහන්සේ සුදුසු වූ සේක. ඒ මග වැඩි උතුමන්ද බුහුමනට සුදුස්සෝය. එවන් උතුමන් වචනයේ අර්ථයෙන් කල්‍යාණ මිත්‍රයෝය. මිහිඳු මාහිමියන් වහන්සේ ආයර්‍ය භාවයට පත් තම සහෝදරියද අප රටට වැඩම කරවා එම ජීවිත දෙකම අප වෙනුවෙන් කැප කොට මෙහිම පිරිනිවන් පෑහ. ඒ උතුමන්ගේ පැමිණීම අප කරන ලද පෙර පිනකි.එසේ නොවන්නට අප බුදුගුණ නොදත් පිරිසක් බවට පත් වනු ඇත. බුදුබණ එක පදයක් හෝ ඉහත කී ගුණයෙහි පිහිටා කියා දෙන ඇත්තන් අතිශ්‍ය දුර්ලභය ඒ බව ,තථාගතපප වෙදිතසස ධමම විනයසස දෙසෙතා පුගගලො දුලලභො ලොකසමිං, (තථාගතප්‍රවිදිත ධර්ම විනය දෙසන පුද්ගලයෝ ලෝකයේ දුර්ලභය) යනුවෙන් පාතුභාව සූත්‍රයේ වදාළහ. ලෝකයේ පරම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ අපට හඳුන්වා දුන් මිහිඳු මහරහතන් වහන්සේ ගෞරව බහුමානයට සුදුසු වෙයි. පොසොන් පෝයට පමණක් සීමා නොකොට සංදර්ශනයටම නොව උන් වහන්සේ කියා දුන් ආයර්‍ය මාර්ගයේ යමින් ශ්‍රාවක වූ අප සෑම විහාරස්ථානයකදීම, නිවසේද, උදේ සවස උන් වහන්සේගේ ගුණ සිහිකොට

බුහුමන් දැක්වීම යුතු කමකි. අප්‍රමාණ කුසල් වැඩීමටද හේතුවේ. සැමදා අපේ ජීවිතය පොසොන් කලාපයක් කර ගනිමු.

වක්තෘද වෙයි. (වතතාච) යමෙක් වැරදි මගක් ගත්තේ නම් නොසඟවා එහි ආදීනව දක්ෂ ලෙස කියා දී යහපතෙහි පිහිටුවාද ඔහු වක්තෘය එවැනි අය ලෝකයේ කොතෙකුත් පහළ වී ඇත මතුවට ද පහළවේ. භාග්‍යවතුන් වහන්සේ වදාරණ ලද්දේ යමෙක් තමා යහපතෙහි පිහිටා නුවණ ඇතිව අනුන්ටද ඒ යහපතින් දක්ෂ ලෙස අවවාද කොට කියාදී මෙලොවින් පරලොවින් සැපවත් වී පරම සැපය වූ සසර දුක් කෙළවර කිරීමට මග කියා දීමයි. එවැන්නන් අතුරින් අගතැන්පත් වුයේ බුදුපියාණන් වහන්සේමය. ලක්වාසී බෞද්ධ ජනතාවට මිහිඳු මහරහතන් වහන්සේ ඒ කල්‍යාණ මිත්‍ර ගුණයෙන් යුතු වක්තෘවරයාණෝය. උන්වහන්සේලා ආදර්ශ කොට අපේ ජීවිතයන්ද හැඩගසා ගනිමින් තමන්ගේ තරමට අන් අයටද දුටු වරද හැකි පමණින් දක්ෂව කියාදී මතුවට සිදුවීමට ඇති දුකින් මිදවීමෙහි නියුතුවී මිත්‍රධර්මයට හිමිකරුවන් වෙමු. එය අපට කළ හැකි උතුම් පොසොන් උත්සවයයි පින්කමයි.

ඇදහිය හැකි වචන ඇති කෙනෙකුද වෙයි( වචනකඛමො) භාග්‍යවතුන් වහන්සේ යම් වචනයක් මුවින් වදාරණ ලද්දේද එය හැම සත්වයනටම ඇදහිය හැකි මෙන්ම උපද්‍රව පිණිස ද නොවන්නේය. තවද, රාග, ද්වේශ, මෝහ යන තෙවැදෑරුම් කෙළෙස් ගිනි නිවීමෙන් පැමිණිය යුතු සියලු සසර දුක් කෙළවර කිරීම පිණිස හේතු වන්නේය. එහෙයින් ඒ බුද්ධ වචනය මේ ලෝකයේ ඇති වචන අතුරින් ඇදහිය හැකි හැමට උතුම් වූ වචනය වන්නේය. එමෙන්ම මිත්‍රත්වය පෝෂණය වීම සඳහා බුදුරජාණන් වහන්සේ නැවත නැවත කළ යුතු යහපත් ක්‍රියා දෙකක් ධම්ම පදයෙහි භිකඛු වගගයෙහි වදාරා ඇත. එනම් ආමිස පටිසන්ථාරය සහ ධමමපටිසන්ථාරයයි. ආමිස පටිසන්ථාර යනු සිව් පසයෙන් සංග්‍රහ කිරීමටයි. ධම්ම පටිසන්ථාර යනු ධර්මාවවාදයෙන් ගුණ දහමෙහි පිහිටුවීමයි එවිට ඇතිවිය හැකි සුළු හෝ ප්‍රමාද දෝෂ අතුරු සිදුරු වැසී ගොස් ප්‍රතිසංස්කරණය වී මිත්‍ර ධර්මය දියුණු වේ. මිහිඳු මහරහතන් වහන්සේ ආමිස හා ධමම පටිසන්ථාරයෙන් රජ ඇතුළු රට වාසීන්ට කල්‍යාණ මිත්‍රයෙකු විය.

ගැඹුරු වචන කියන්නේද වේ. (ගමභීරඤ්ච කතං කත්තා) මිහිඳු මාහිමියන් වහන්සේ ගැඹුරු දේ ලක්වාසීන්ට කියා දුන්හ. ඒ අතර තෙරුවන් ගුණ කියාදී පින්පව් සහ කර්මය කර්මඵලය කියා දුන්හ. සීලයෙහි පිහිටුවා දෙවියන් යනු කුමන ආකාරයේ ස්වභාවයකින් යුතු කෙනෙකුද, සතර අපාය, නිරය කුමන ආකාරයේ සත්වයින් උපදින තැනක්ද ත්‍රිලක්ෂණ යනු කුමක්ද, මිථ්‍යාව කුමක්ද, ආයර්‍යසත්‍ය යනු කුමක්ද, ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය සහ පටිච්ච සමුත්පාදය අභිධර්මය වැනි ගැඹුරු දහම කියා දී මනුෂ්‍යයාට මෙලොවදීම එහි ඵල විද්‍යාමාන කළහ. දුකින් මිදීමේ මග පෙන්වූහ. රට තුළ ආර්ථිකය නැංවීමට (දැහැමි ලෙසට) මග පෙන්වා වදාළහ. ඒ හැම ප්‍රාර්තිහාර්‍ය්‍යයක්ම කළේ ඇදහිය හැකි දහමක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ බැවිනි. බොහෝ විට අද සිදුවන්නේ ඇදහිය නොහැකි ඇස්පනා පිටම උන්හිටි ගමන් වෙනස් කරන සමාජය මුලා කරන නොමග යවන තම පෞද්ගලික වාසියට වචන කතා කිරීමයි. ඒ මානව හිතවාදී මිත්‍රයෝද යන්න තම තමන් තීරණය කළ යුතුය. තිස් අටක් මංගල කාරණා තුළින් පාප මිත්‍ර වර්ජනය සහ කල්‍යාණ මිත්‍ර සේවනය යහපතක් වන බව වදාළහ.

( අසෙව නා ච බාලානං - පණ්ඩිතානඤ්ච සෙවනා) පණ්ඩිත යන වචනයෙන් දැක්වෙනුයේ පිං පව් මෙලොව පරලොව හඳුනන උතුමන්ය.ඔවුන් දුර්ලභය. ඔවුන් ඇසුරට ලැබෙන පිරිසට ගැඹුරු හරවත් කථා තුළින් මිත්‍ර ධර්මය පෝෂණය කරයි. එවැන්නන් විසින් පලවා හැරියත් ඇසුරු කළ යුතු යයි වදාරා ඇත. භාග්‍යවතුන් වහන්සේ ලෝවැසි ජනයා උපමා තුනකින් කොටස් තුනකට බෙදූහ. අන්ධයෝය, එකැස් ඇත්තෝ සහ දෑසම ඇත්තෝ යනුවෙනි.අන්ධයෝ මෙලොව පරලොව ගැන නොසිතන්නෝය. එකැස් ඇත්තෝ මෙළොව පමණක් සිතා පරලොව ගැන නොසිතයි. මෙලොව පරලොව දෙලොවෙහිම යහපතට කටයුතු කරන්නා දෑසම ඇත්තෝය. මිහිඳු මා හිමියන් රාජකීයයන්ටද රටේ සාමාන්‍ය ජනයාටද එකසේ මෙලොව පරලොව අර්ථය වටහා දුන්හ. ඒ උතුම් කල්‍යාණ ගුණයයි. අපද එපමණටම බැරි වුවද දෙලොව අර්ථය දැන සුවපත් වී අන්‍යයෝද සුවපත් කරමු. එය නිවැරදි පොසොන් පින්කම වේ.

අසථානයෙහි නොයොදවයි. (නො චටඨානෙ නියොජයෙ) හත් වැනි ලක්ෂණය ලෙස භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනුයේ තම මිත්‍රයන් අසථානයෙහි නොයෙදීමයි. නොමග නොයැවීමයි. මිහිඳු මහරහතන් වහන්සේ බුදු දහම කියා දී ජනතාව ස්ථානයේ යෙදවූහ. කොටින්ම කියනවා නම් මධ්‍යම ප්‍රතිපදාව පෙන්වා දුන්හ. තමන් වහන්සේට ලැබෙන රාජකීය ගෞරව සංග්‍රහයන්ට යට නොවී රජුද නිසි තැන යෙදවීමට අනුශාසනය කළහ. රජු සහ රටේ සම්පත් වුව ද අස්ථානයේ නොයෙදවූහ. රට වැසියාද නොමගින් මගට ගත්හ. දුගතිය වලකා සුගතියෙහි පිහිට වූහ. එනමුත් කිව

යුත්තක්ද ඇත මිහිඳු මා හිමියන් අද වැඩ සිටියා නම් ඇතැම් බෞද්ධයෝ ධර්මයෙන් විනයෙන් බැහැර වී කටයුතු කරන ආකාරය වසන් කළ නොහැක. එබැවින් සූත්‍රයේ සඳහන් පරිදි "අපි නාසියමානෙන භජිතබ්බා තථාවිධොති" (නෙරපනු ලැබුවත් එවැනි උතුමන් භජනය කළ යුතුය.) යන අදහස නිසා එවන් අයට සමාව ඇත. නැති නම් නෙරපනු නොඅනුමානය. නෙරපනු ලැබුවත් නැවත නැවත මේ ගුණ හතෙන් යුතු උතුමෝ ඇසුරු කළ යුතුමයි කිවේ තව දුරටත් මඩෙහි දැමීමට නොව නැවත නැවත දහමෙහි පිහිටා නිවැරදි වීමටය. උන් වහන්සේ උතුම් මිත්‍ර ධර්මයෙන් යුතු ප්‍රියමනාප බුහුමන් කළ හැකි ඇදහිය හැකි ගුරුවරයෙකි. ගැඹුරු තෙවලා දහමින් දක්ෂලෙස ජනයා නිසි මග යෙදවූ නාථයන් වහන්සේය. ලක්වැසි ජනතාවට අනු බුදුරජාණන් වහන්සේය. මිත්‍ර ධර්මයෙන් පරිපූර්ණවූ උන්වහන්සේ අනුගමනය කොට ගිහි පැවිදි අප සැවොම එම මිත්‍ර ධර්ම සත අප ජීවිත තුළද විද්‍යමාන කර ගනිමු. අප ඇසුරු කරන දූ දරු ආදීන්ටද ආදර්ශ වෙමු. එම ගුණයෙහි පිහිටා යම් පමණකට හෝ මිත්‍ර ධර්මයෙන් යුතුව දෙලොව අභිවෘද්ධිය ඇති කර ගැනීමට මේ දින කිහිපය නොව නිවන් දකින තුරු ඉහත කී ගුණ හතෙන් යුතු උතුමෝ අප නෙරපුවත් ඇසුරු කරමු, අපද එවැනි මිත්‍රයෝ  වෙමුයි මෙම පොසොන් පෝදා අදිටන් කර ගනිමු.

මිහිඳු මහරහතන් වහන්සේ වන්දනා කරන ගාථාව

ජම්බුදීපා සමා ගම්ම - දෙසිත්වා ධම්ම මුත්තමං

පතිට්ඨාපෙසි යො නාථො - ලඞ්කායං බුද්ධ සාසනං

අරහං තං මහින්දං තං - අනුබුද්ධං නමාමහං

"යම් නාථයන් වහන්සේ නමක් දඹදිවින් පැමිණ උතුම් ධර්මය දේශනා කොට ලංකාවේ. බුද්ධ සාසනය පිහිටු විද ඒ අරහත් වූ අනුබුදු මිහිඳු හිමියන්ට මම වඳිමි."

(2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය අරමුණු කොට මහා සංඝරත්නයේ අනුශාසනා ඇතිව වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදය සිදු කළ මිහිඳු මහරහත් මා හිමි උපහාර මහා පිංකමට සංසදයේ ආරාධනයෙන් අග්ගමහා පණ්ඩිත උත්තරීතර මහා නායක ධුරන්දර දවුල්දෙණ ඤාණිස්සරාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචනා කරන ලද මෙම ගාථාව සැදැහැවතුන්ට මිහිඳු මහරහතන් වහන්සේ වන්දනා කිරීමේදී භාවිතා කිරීමට  මෙසේ පළ කරමු.)